# <u>දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය</u>

## දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2021

## දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සිංහල මාධ්‍ය පාසල් වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

**** විශේෂයෙන් සැළකිය යුතුයි****

**මෙම විභාගය සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා මාර්ගගතව (Online) පමණක් අයදුම්කල යුතු ය.**

**මෙම විභාගයට අදාළ කේතය - OP21401**

**01.යෝග්‍යතා**

**1:1 - මූලික සුදුසුකම්**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
II. ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් සුවිශේෂී කරන ලද විෂයය ක්ෂේත්‍ර වලට අයත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක දකුණු පළාතේ අඛණ්ඩ පදිංචිය හෝ පූර්වාසන්න වසර 03 ක කාලය තුල කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමග අයදුම්කරුගේ පූර්වාසන්න එක් වසරක පදිංචිය තිබිය යුතු ය.
IV. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.
V. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2003.05.21 හෝ ඊට පෙර හා 1986.05.21 වැනි දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ඇත.
VI. යම් විෂයයක් සඳහා දකුණු පළාතේ ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී පමණක් වෙනත් පළාත් වල පදිංචි අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.
VII. දැනට රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ද ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් මේ සඳහා අයදුම් කල හැක.

**1:2 - අධ්‍යාපන සුදුසුකම්**

1:2:1 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පහත දැක්වෙන සුදුසුකම්, 2017.08.29 දිනැතිව ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ III පරිශිෂ්ඨයේ දක්වා ඇති පරිදි ගුරුවරුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම" යන මැයෙන් අධ්‍යාපන අමාත්‍යතුමා 2017.07.20 දිනැතිව ගරු අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා අංක 2 හි දක්වා ඇති පරිදි සපුරා තිබිය යුතු ය.

| විෂයය | සුදුසුකම් |
|---|---|
| ගණිතය | අ.පො.ස. (උ.පෙළ) ගණිතය/විද්‍යාව විෂයය ධාරාව යටතේ උසස් පෙළ විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය ප්‍රධාන විෂයය ලෙස විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. [ අ.පො.ස. (උ.පෙළ) දක්වා ගණිතය විෂයය ඉගැන්වීමට සුදුසුකම් තිබිය යුතු ය.] |
| විද්‍යාව | අ.පො.ස. (උ.පෙළ) ගණිතය/විද්‍යා විෂයය ධාරාව යටතේ උසස් පෙළ විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව/රසායන විද්‍යාව / ජීව විද්‍යාව /උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව යන විෂයයන් වලින් අවම වශයෙන් එක් විෂයයක් හෝ ප්‍රධාන විෂයය සහිතව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. (ඉහත විෂයයන් අතරින් සුදුසුකම් ලත් විෂයය/විෂයයන් අ.පො.ස. උසස් පෙළ දක්වා ඉගැන්වීමට සුදුසුකම් තිබිය යුතු ය.) |

| | |
|---|---|
| ඉංග්‍රීසි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍ය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| නාට්‍ය හා රංග කලාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් නාට්‍ය හා රංග කලාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| චිත්‍ර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් චිත්‍ර ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| නැටුම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් භාරත හෝ දේශීය නර්තනය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| සංගීතය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් කර්ණාටක/දේශීය/බටහිර සංගීතය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| තොරතුරු තාක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| කෘෂි විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂි විද්‍යාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| ප්‍රාථමික | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිංහල/ජනසන්නිවේදනය/ජනමාධ්‍යය/සන්නිවේදන අධ්‍යයනය/පුවත්පත් කලාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| සිංහල | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍ය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| ඉතිහාසය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉතිහාසය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| පුරවැසි අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් මානව විද්‍යාව/සමාජ විද්‍යාව හෝ දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| දේශපාලන විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් දේශපාලන විද්‍යාව හෝ අන්තර්ජාතික සබඳතා ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| භූගෝල විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| බෞද්ධ ශිෂ්ටාචාරය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් බෞද්ධ ශිෂ්ටාචාරය/බෞද්ධ සංස්කෘතිය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| ව්‍යාපාර අධ්‍යයනය | අ.පො.ස. (උ.පෙළ) වානිජ්‍ය විෂයය ධාරාව යටතේ උසස් පෙළ විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් වානිජ්‍යවේදී උපාධිය/ ව්‍යාපාර පරිපාලන උපාධිය/ රාජ්‍ය පරිපාලන උපාධිය ලබා තිබීම. |
| ආර්ථික විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| ගිණුම්කරණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජනමාධ්‍ය හෝ ජන සන්නිවේදනය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |
| ශිෂ්‍ය උපදේශනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් මනෝ විද්‍යාව/ උපදේශනය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් එක් අවුරුද්දකට නොඅඩු උපදේශනය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම. |

1:2: 2. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව සම්මාන 3ක් ලබා විෂයයන් 6කින් සමත් වීම.

1:2:3. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එක්වරකදී විෂයයන් 3 කින් සමත්වීම.

## 02. බඳවා ගැනීමේ ක්‍රමය

2.1 දකුණු පළාත් සභා පාසල් වල පවතින ගුරු පුරප්පාඩු වෙනුවෙන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ට අයදුම් කල හැකි ය.

2.2 2008.07.01 දින සිට ක්‍රියාත්මක නව ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4 වගන්තිය අනුව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකට යොමුකර එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්ගෙන් පමණක් පහතින් දක්වා ඇති ආකාරයට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

2.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය මගින්, මාර්ගගතව ලියාපදිංචි වන අයදුම්කරුවන්ගෙන් ඉහත 2.2 හි දක්වා ඇති තරඟ විභාගයෙන් සුදුසුකම්ලත් (ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය සමත්වන) අයදුම්කරුවන් දකුණු පළාතේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ස්ථිර පදිංචි අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල්වල ඇබෑර්තු සම්පූර්ණ කිරීමේදී ප්‍රථමයෙන් බඳවා ගනු ලැබේ. එහිදී බඳවා ගන්නා විෂයට අදාළ ඉහත 1.2.1 හි සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම සහ උපාධියට පන්ති සාමාර්ථයක් සහිත අයදුම්කරුවන් තරඟ විභාගයේදී ලබාගත් ලකුණු අනුපිළිවෙල (ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු වල එකතුව) අනුව ප්‍රථමයෙන් බඳවා ගැනීමෙන් අනතුරුව යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තවත් පුරප්පාඩු පවතී නම් තරඟ විභාගයේ ලකුණු (ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු වල එකතුව) පදනම් කරගනිමින් අනෙක් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ. යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ස්ථිර පදිංචිය ඇති (මෙම නිවේදනයේ 1.1 හි III ඡේදයේ දක්වා ඇති පරිදි) සුදුසුකම්ලත් අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් නොමැති නම් ප්‍රථමයෙන් ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් ද දෙවනුව ඊළඟ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින්ද සුදුසුකම් සහිත අපේක්ෂකයින් තෝරාගනු ලැබේ.

2.4 බඳවා ගැනීම් සිදුකරන සෑම පියවරකදීම බඳවා ගන්නා විෂයයට අදාල සුදුසුකම් සහිත අයදුම්කරුවන් අතරින් පන්ති සාමාර්ථ සහිත අයදුම්කරුවන් බඳවා ගැනීම ප්‍රථමයෙන් සිදු කරනු ලැබේ.

2.5 ලිඛිත විභාගය සමත්වීම සඳහා සෑම විෂයයකටම 40% ඉක්මවා ලකුණු ලබාගත යුතු අතර, ලිඛිත විභාගය සමත්වන අයදුම්කරුවන් පමණක් ගුරුසේවා ව්‍යවස්ථාවේ 7.2.4.2 සහ 7.2.4.4.1 (2) හි දැක්වෙන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමුකරනු ලැබේ.

2.6 විශ්‍රාම යාම, වෙනත් පළාතකට ස්ථාන මාරුවීයාම, වෙනත් සේවයක උසස්වීම් ලැබීම හේතුවෙන් ඇතිවන ගුරු පුරප්පාඩු ද මේ යටතේ සම්පූර්ණ කිරීමට අපේක්ෂිත අතර, එහිදී ඇතිවන ඇබෑර්තු සම්පූර්ණ කිරීම ද ඉහත 2.1, 2.2, 2.3, 2.4, 2.5, අනුව සිදු කෙරේ.

## 03. ඉල්ලුම් කිරීමේ ක්‍රමය

3.1. මෙම විභාගය සඳහා අයදුම් කිරීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.sp.gov.lk** මගින්, මාර්ගගතව පමණක් සිදුකළ යුතු ය.

3.2 අන්තර්ජාලය හරහා විභාගය සඳහා ලියාපදිංචි වීමේදී සෑම අයදුම්කරුවෙකු සතුව වලංගු ජාතික හැඳුනුම්පතක්, ඔබගේ හෝ ඔබට තොරතුරු සැපයීමට හැකි ළඟම පුරවැසියෙකුගේ සක්‍රීය ජංගම දුරකතන අංකයක් හා විභාග ගාස්තුවට අදාළ මුදල ගෙවූ රිසිට් පතද තිබීම අත්‍යාවශ්‍ය වේ. විභාගය පිළිබඳ සියලුම තොරතුරු පසුව දැනුම් දෙනු ලබන්නේ ඔබ විසින් සපයන ලද ජංගම දුරකතන අංකය හරහා වේ.

3.3 විභාගය සඳහා තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ මාර්ගගතව අයදුම්කර ඇති සියලු අයදුම්කරුවන්ට මෙම විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

3.5 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කල යුතු ය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

3.6 විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට නොහැකි වූ අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දුරකතන අංක 091-2234309/ 0912248450 ඔස්සේ දැන්විය යුතු ය.

i. විභාගයේ නම
ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම
iii. සම්පූර්ණ ලිපිනය
iv. විභාග ගාස්තුව ගෙවූ බැංකු ශාඛාව හා ගෙවූ දිනය
v. විභාගය සඳහා ලියාපදිංචි වූ දිනය

**04. විභාග ගාස්තු**

4.1 මෙම විභාගයේ විභාග ගාස්තු ලෙස රුපියල් 1000 ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ලංකා බැංකුවේ ගාල්ල කොටුව ශාඛාවේ ගිණුම් අංක 87262909 දරන ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත යන ජංගම ගිණුම ට බැර කළ යුතු අතර, මුදල් තැන්පතු පත්‍රිකාවේ අයදුම්කරුගේ ජාතික හඳුනුම්පත් අංකය හා මෙම විභාගයට අදාල විභාග කේත අංකය වන OP21401 යන්න සඳහන් කළ යුතු ය.

උදා:

| | |
|---|---|
| ගිණුම් අංකය | - 87262909 |
| ගිණුම් හිමියගේ නම සහ ලිපිනය | - ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| ජා.හැ.ප/ගමන් බලපත්/රියදුරු බලපත් අංකය | - අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය |
| දුරකතන අංකය | - අයදුම්කරුගේ ජංගම දුරකතන අංකය |
| තැන්පතුවේ අවශ්‍යතාවය | - op21401 |

4.2 මුදල් ගෙවූ රිසිට් පත සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළයුතු වන බැවින්, එය ආරක්ෂාකාරීව ළඟ තබා ගත යුතු ය. (මෙම රිසිට් පතෙහි මුල පිටපත සම්මුඛ පරීක්ෂණයේදී දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කල යුතු ය.)

4.3 විභාග ගාස්තු නියමිත පරිදි නොගෙවීම සහ තොරතුරු නිවැරදිව ලබා නොදීම හේතුවෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**05. අයදුම්කිරීම**

5.1 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) මගින් අන්තර්ජාලය හරහා මාර්ගගතව 2021.05.21 දින හෝ ඊට පෙර අයදුම් කළ යුතු ය.

5.2 අන්තර්ජාලය හරහා විභාගය සඳහා ලියාපදිංචි වන සෑම අයදුම්කරුවකුම අයදුම්පත්‍රයේ පිටපතක් අනිවාර්යයෙන්ම ලඟ තබාගත යුතු වේ. විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) මගින් ලබා ගත හැකි අතර, එහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගෙන එහි සඳහන් නීති රීති මැනවින් අනුගමනය කිරීම ඔබ සතු වගකීමකි.

සටහන : ලියාපදිංචිය මාර්ගගතව පමණක් සිදු කරන බැවින්, කිසිදු ලෙසකින් අයදුම්පත්වල දෘඪ පිටපත් මෙම කාර්යාලය වෙත එවීම අවශ්‍ය නොවේ.

**06. වෙනත් කොන්දේසි**

6.1 මුලින් පත්වීම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවම වශයෙන් වසර 05 ක් සේවය කළ යුතු වේ

6.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

6.3 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

6.4 උසස් වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදුකරනු ඇත.

6.5 උපාධියට අදාළ විෂයයන් යටතේ අයදුම්කළ යුතු අතර, පත්වීම් විෂයය කිසිදු හේතුවක් නිසා වෙනස් කරනු නොලැබේ.

6.6 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය වන ජී-ඊ-1-2016 දරණ වැටුප් කාණ්ඩය (මාසික රු. 27,740 – 6x300 – 7x380 – 9x445 – 36,205 ක්) වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 32,200.00 ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

**07. විභාග ක්‍රමය**

7.1 ලිඛිත තරඟ විභාගය

| විෂයය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය - (කලය පැය 01යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම - (කාලය පැය 01යි) | 100 | 40 |

7.1.1 ලිඛිත තරග විභාගය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

7.2 ප්‍රායෝගික පරීක්ෂණය

අයදුම්කරු විසින් අයදුම්කරන විෂයයට අදාල හඳුනාගත් මාතෘකාවක් යටතේ විනාඩි පහක (05) ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් සිදුකල යුතු වේ. මෙහිදී පහත පරිදි ලකුණු විසිපහක් (25) ලබා දෙනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ටවීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

7.2.1 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5ක කාලයක් දෙනු ලැබේ.

ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතු ය.

08. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද, බඳවා ගැනීමේ ක්‍රමයට අදාළ කොන්දේසි සංශෝධන ද , කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය ගැනීම දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් සිදු කරනු ලැබේ.

රංජිත් යාපා
ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය.